# 2022.06.09 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ නව සභා රැස්වීම් ශාලාවේදී පැවති හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව

**පැමිණීම**

1. බී. කන්දසාමි මහතා - ගරු සභාපති
2. වයි.එම්.නිමල් අමරසිරි මයා - ගරු උපසභාපති
3. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
4. සවරිමුත්තු ප්‍රභාහර් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
5. මාරප්පන් කන්දසාමි මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
6. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
7. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
8. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
9. එල්.එච්. ඉන්දික සම්පත් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
10. එෆ්. වයලට් රෝස් මහත්මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
11. ගෝපාලන් මුරුගන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. ඩී. සුදත් අරුණඅංජන මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
13. තංගවේලු මහේන්ද්‍රන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
14. ආර්.එම්. අනුලාවතී මල්ලිකා මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
15. එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
16. වේලුසාමී එලීල් අරසි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
17. ආර්.එල්.සුදර්ශන මහතා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

## 01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.05.12 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා යෝජනා අංක 05 යටතේ දක්වන ලද අදහස් යටතේ දියතලාව නගරයේ බස් නැවතුම්පොළ අසළ පිහිටා ඇති ඉඩම් කොටස **වෙනත් අයෙකුට පැවරීම** සම්බන්ධයෙන් සභාවට කිසිදු තීරණයක් ගත නොහැකි බවත් **සභාව වෙත පැවරීම** සඳහා මැනුම් කටයුතු මේ වන විට සිදු කර අවසන්ව ඇති බවත් ප්‍රකාශ කරන ලද බව සඳහන් විය යුතු බවට සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

එකී සංශෝධනයට යටත්ව ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

- හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව
- ඌව පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ 2022-05-17 වන දිනැති අංක 12/4/3/1/19 දරණ රාජ්‍ය වියදම් පාලනය කිරීම - රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 3/2022
- හපුතලේ ප්‍රාදේශීය සභාවෙහි සුභ සාධක සංගමය විසින් සංවිධානය කරනු ලබන පොසොන් මහා දන්සල 2022-06-14 වන පොසොන් පොහොය දින පැවැත්වෙන බව දැනුම් දීම.
- 2023 වර්ෂයේ අයවැය සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ දී ප්‍රතිලාභීන් සංඛ්‍යාව සඳහන් කිරීමේ දී ස්ත්‍රී, පුරුෂ , ළමා ආදී ලෙස වෙන වෙනම යෝජනා ඉදිරිපත් කරන ලෙස දැනුම් දීම.

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාහර් මහතා</u>
  - කහගල්ල වත්ත, හපුතලේ හි පදිංචි එස්. අරුල්මේරි මිය විසින් වැසිකිළිය සාදා ගැනීම සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉදිරිපත් කර ඇති ලිපිය
- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා</u>
  - තංගමලේ වත්ත ඒ කොටසෙ හි පිහිටා ඇති ශ්‍රී මරුදවීරන් දේවාලයේ ජලය ගබඩා කිරීම සඳහා ලීටර් 5000 ජල ටැංකියක් ලබා දෙන ලෙස ඉදිරිපත් කර ඇති ලිපිය
  - ලීටර් 5000 ජල ටැංකියක් ලබා දෙන ලෙස ඉදිරිපත් කර ඇති ලිපිය
- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී වී.එලීල් අරසි මිය</u>
  - පිටරත්මලේ පහළ කොටස ,හපුතලේ පදිංචි තෝමස් මෙතියුස් මහතා විසින් නිවස ඉදිරිපිට පිහිටි අනතුරුදායක ගස ඉවත් කර දෙන මෙන් ඉදිරිපත් කර ඇති ලිපිය
- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එෆ්. වයලට් රෝස්</u>
  - ඇස් සඳහා සැත්කමක් කිරීමට සිදුව ඇති බැවින් ඒ සඳහා මූල්‍යාධාරයක් ලබා දෙන ලෙස ඉදිරිපත් කර ඇති ලිපිය

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

දියතලාව පොදු වෙළඳපොල මාසික ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් 2022.02.11 වන දින ගරු සභාවේ ගන්නා ලද තීරණය අනුව 2022 අප්‍රේල් මස සිට ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් කඩහිමියන් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපියට අනුව එකී කඩකාමරවල 2022 ජනවාරි සිට මාර්තු දක්වා වූ රු. 17,106.13 ක ජල බිල්පත සභා අරමුදලින් ගෙවීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා

විවාද

දියතලාව පොදු වෙළඳපොල මාසික ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් 2022.02.11 වන දින ගරු සභාවේ ගන්නා ලද තීරණය අනුව 2022 අප්‍රේල් මස සිට ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් කඩහිමියන් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපියට අනුව එකී කඩකාමරවල 2022 ජනවාරි සිට මාර්තු දක්වා වූ රු. 17,106.13 ක ජල බිල්පත සභා අරමුදලින් ගෙවීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයේ හපුතලේ සිට දියතලාව හරහා ගමන් ගන්නා මගී ප්‍රවාහන බස් රථ වල දියතලාව මූලික රෝහල වෙත දෛනිකව ප්‍රතිකාර සඳහා මෙන්ම රෝගීන් බැලීම සඳහා පැමිණෙන පුද්ගලයන් පොදු ප්‍රවාහන බස් රථ මගින් දියතලාව මූලික රෝහල ආසන්නයෙන් බැස්සවීමට කටයුතු නොකරන බැවින් රෝගී ජනතාව මෙන්ම ප්‍රජාව මුහුණ දෙන අපහසුතාවය සලකා බලා දියතලාව මූලික රෝහලට පිවිසෙන මාර්ගය ඉදිරිපස දිගු ගමන් සේවා හා අනෙකුත් බස් රථ සඳහා බස් නැවතුම්පළක් ස්ථාපිත කිරීම සුදුසු බවට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයේ හපුතලේ සිට දියතලාව හරහා ගමන් ගන්නා මගී ප්‍රවාහන බස් රථ වල දියතලාව මූලික රෝහල වෙත දෛනිකව ප්‍රතිකාර සඳහා මෙන්ම රෝගීන් බැලීම සඳහා පැමිණෙන පුද්ගලයන් පොදු ප්‍රවාහන බස් රථ මගින් දියතලාව මූලික රෝහල ආසන්නයෙන් බැස්සවීමට කටයුතු නොකරන බැවින් රෝගී ජනතාව මෙන්ම ප්‍රජාව මුහුණ දෙන අපහසුතාවය

සලකා බලා දියතලාව මූලික රෝහලට පිවිසෙන මාර්ගය ඉදිරිපස දිගු ගමන් සේවා හා අනෙකුත් බස් රථ සඳහා බස් නැවතුම්පළක් ස්ථාපිත කිරීම සුදුසු බවට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා අදහස් දක්වමින් දියතලාව ප්‍රධාන බස් නැවතුම්පොළෙ හි ඉදිරිපිට පවා මේ වන විට පොලීසිය විසින් බස් රථ නතර කිරීමට ඉඩ ලබා දීමක් සිදු නොවන බවත් , බස් නැවතුම්පළ භූමියෙ හි විශාල වළක් සහිත බවත් පසුගිය දිනයකදී ඒ හේතුවෙන් බස් රථයක ගමන් ගත් මගියකුගේ පාදයක් අනතුරකට ලක් වූ බවත් මීට කඩිනමින් විසඳුම් ලබා දිය යුතු බවත් ප්‍රකාශ කළ අතර මේ දින වල වර්තමාන ආර්ථික රටාව තුළ පෞද්ගලික බස් රථහිමියන් දැඩි අපහසුතාවයකට ලක් වී ඇති මොහොතක දියතලාව මූලික රෝහලට පිවිසෙන මාර්ගය ඉදිරිපස දිගු ගමන් සේවා හා අනෙකුත් බස් රථ සඳහා බස් නැවතුම්පළක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සිදු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් තව දුරටත් සිතා බැලිය යුතු බවත් එලෙස බස් නැවතුම්පොළක් ස්ථාපිත කළහොත් දුර ගමන් සේවා සඳහා මගී ජනතාව හුරුවන බවත් එවිට දියතලාව නගරයෙන් ආරම්භ වන බස් රථ සඳහා මගීන් ගේ අඩු වීමක් සිදු විය හැකි බැවින් වත්මන් ආර්ථිකය හමුවේ තවදුරටත් පෞද්ගලික බස් රථ හිමියන් මෙකී කරුණු හේතුවෙන් අපහසුතාවයට ලක් වන බවත් එම නිසා මෙම යෝජනාව තාවකාලිකව නතර කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් දියතලාව ප්‍රජාවට සිදු වන අපහසුතාවය හේතුවෙන් මෙම යෝජනාව තාවකාලිකව නතර කිරීම සුදුසු බවට අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව තාවකාලිකව නතර කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2022 ජූලි මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි..එම්.නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

2022 ජූලි මස 12 වන දින මහ සභාව පැවැත්වෙන දිනය ලෙස තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

### <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස් . සගාදේවන් මහතා</u>

එස්. සගාදේවන් මහතා නියෝජනය කරනු ලබන කොට්ඨාසය වෙත මෙම වර්ෂය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන යටතේ ග්ලැන්නෝර් වත්ත , අංක 18 ලයම සඳහා ලීටර 10000 ජල ටැංකියක් සහ

ලීටර 5000 ජල ටැංකියක් හා අංක 04,07,10 හා කෝවිල් සඳහා ජල ටැංකි ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා

විවාද

එස්. සගාදේවන් මහතා නියෝජනය කරනු ලබන කොට්ඨාසය වෙත මෙම වර්ෂය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන යටතේ ග්ලැන්නෝර් වත්ත , අංක 18 ලයම සඳහා ලීටර 10000 ජල ටැංකියක් සහ ලීටර 5000 ජල ටැංකියක් හා අංක 04,07,10 හා කෝවිල් සඳහා ජල ටැංකි ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## හදිසි යෝජනා

## යෝජනා අංක 01

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතෙල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවරුම් නියෝග ඇසුරින් පවරා දීමට මූලික කටයුතු සිදු කර ඇති ඒ සඳහා මැනුම් ගාස්තු අප ආයතනය විසින් ගෙවා ඇති දියතලාව පොලීසියට යාබද ව පිහිටි නා.මැ.මු.පි.28 හි පත්‍ර අංක 84 හි කට්ටි අංක 1464 අංක දරණ සැලසුමට අදාළ ඉඩමෙ හි පිහිටා ඇති පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය විසින් අලුත්වැඩියා කර අප ආයතනය වෙත විධිමත්ව භාර දී ඇති අතර එම ගොඩනැගිල්ලෙ හි එක් කොටසක් පමණක් දියතලාව පොලිස් ස්ථානයේ සංවර්ධන කටයුතු සිදු කරන තුරු තාවකාලිකව පොලීසියේ කාර්යයන් සඳහා 2022.12.31 දක්වා ලබා දී තිබූ අතර එහි ඉතිරි කොටස අප ආයතනයට භාර දෙන ලෙස ඉල්ලීම් කළ පසු එය දියතලාව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරන බැවින් එම ගොඩනැගිල්ල අප ආයතනය වෙත ලබා ගැනීම සඳහා නඩු පැවරීමටත් ඒ සඳහා නීතීඥ විශ්වනාත් ආර්. කුලතුංග මහතා වෙත අදාල කටයුතු ඉටු කිරීමට බලය පැවරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදුත් අරුණ රංජන මහතා

විවාද

හපුතෙල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවරුම් නියෝග ඇසුරින් පවරා දීමට මූලික කටයුතු සිදු කර ඇති ඒ සඳහා මැනුම් ගාස්තු අප ආයතනය විසින් ගෙවා ඇති දියතලාව පොලීසියට යාබද ව පිහිටි නා.මැ.මු.පි.28 හි පත්‍ර අංක 84 හි කට්ටි අංක 1464 අංක දරණ සැලසුමට අදාළ ඉඩමෙ හි පිහිටා ඇති පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය විසින් අලුත්වැඩියා කර අප ආයතනය වෙත විධිමත්ව භාර දී ඇති අතර එම ගොඩනැගිල්ලෙ හි එක් කොටසක් පමණක් දියතලාව පොලිස් ස්ථානයේ සංවර්ධන කටයුතු සිදු

කරන තුරු තාවකාලිකව පොලීසියේ කාර්යයන් සඳහා 2022.12.31 දක්වා ලබා දී තිබූ අතර එහි ඉතිරි කොටස අප ආයතනයට භාර දෙන ලෙස ඉල්ලීම් කළ පසු එය දියතලාව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරන බැවින් එම ගොඩනැගිල්ල අප ආයතනය වෙත ලබා ගැනීම සඳහා නඩු පැවරීමටත් ඒ සඳහා නීතීඥ විශ්වනාත් ආර්. කුලතුංග මහතා වෙත අදාල කටයුතු ඉටු කිරීමට බලය පැවරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැලිදි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ගොඩනැගිල්ල කුලියට හෝ ලබා දීම තුළින් ආදායම් උත්පාදනය කළ හැකි බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා අදහස් දක්වමින් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ගොඩනැගිල්ල හා පිහිටි ඉඩම හපුතලේ සභාව වෙත පවරා දී ඇත්තේ වාචිකව ද , ලිඛිතව ද යන්න විමසීම් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් පළමුව එකී ඉඩම සභාව වෙත පවරා ගැනීමට කඩිනමින් කටයුතු සිදු කළ යුතු බවත් දියතලාව නගරය තුළ පොලීසියට පවරා දෙන ලද ඉඩම් වෙනම පවතින බැවින් මෙම ගොඩනැගිල්ල සභාව වෙත පවරා ගැනීමට අදාළ ලිපි ඉඩම් ආමාත්‍යාංශය වෙත මේ වන විට යොමු කර තිබෙන්නේද යන්න සොයා බලන ලෙසත් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.එසේම ජල බිල්පත් හා විදුලි බිල්පත් වල අයිතිය පවතින්නේ සභාව සතුව ද යන්න වැඩිදුරටත් විමසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මේ වන විට ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් සියලු මූලික කටයුතු මේ වන විට සිදු කර අවසන් බවත් නීත්‍යානුකූලව සියලු පවරා ගැනීම් කටයුතු අවසන් වූ පසු ආදායම් උත්පාදනය සම්බන්ධයෙන් මේ සඳහා තීරණයක් ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**06. කාරක සභා වර්තාව**

2022.06.02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 මැයි මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා සහ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-06.09 වන දින සභාවට සහභාගී නොවීම

සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයන් හට අසනීප නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

## 08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් වර්තමාන ආර්ථික තත්ත්වය හමුවේ මතු වී ඇති ඉන්ධන හිඟතාවය මෙන්ම ඉන්ධන පෝලිම් පිළිබඳව සලකා බලා හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රජාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගැනීමට පහසුකම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් රාජ්‍ය ආයතන සඳහා පැමිණෙන නිලධාරීන් ඇතුලු ප්‍රජාවද , රෝහල සඳහා පැමිණෙන රෝගී ජනතාව මෙන්ම නැරඹීම සඳහා පැමිණෙන්නන් ද, පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන පාසල් වෑන් රථ ඇතුලු පෞද්ගලික බස් රථ මෙන්ම ත්‍රී රෝද රථ සඳහා ද ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස වෙලින්ටන් ඉන්ධන පිරවුම්හලෙ හි කළමණාකාරතැනගෙන් ඉල්ලා සිටීමට කටයුතු කරන බවත් එසේ ප්‍රමුඛතාවය ලබා දීමේ දී එම ආයතනය සතු පෙට්‍රල් සඳහා සවි කර ඇති පොම්ප තුනෙන් එක් පොම්පයක් දියතලාව ප්‍රජාවගේ ඉන්ධන අවශ්‍යතාවය වෙනුවෙන් ද, ඩීසල් සඳහා සවි කර ඇති පොම්ප තුනෙන් එක් පොම්පයක් දියතලාව ප්‍රජාවගේ ඉන්ධන අවශ්‍යතාවය පිළබඳව සලකා බලා වෙන් කිරීම් ආශ්‍රිතව වෙනම පෝලිමක් නිර්මාණය කරන ලෙසත් යෝජනා කරන බව සඳහන් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ඉන්දියන් රජය මගින් ලබා දුන් ආධාර යටතේ ලද වියළි ආහාර ලබා දීම පිළිබඳ ස්තූතිය ප්‍රකාශ කරන බවත් ග්ලැනනෝර් වසම ආශ්‍රිත ප්‍රදේශයන්හි ප්‍රජාව වෙත එකී සහනාධාර හිමි වුවද ඇතැම් වතු ආශ්‍රිත අනු පවුල් ඒකක සඳහා මෙකී සහනාධාර හිමි නොවීම හේතුවෙන් එම ප්‍රජාව වෙත අසාධාරණයක් සිදු වූ බවට ප්‍රකාශ කරන ලදී.ඒ අනුව මේ සම්බන්ධයෙන් සොයා බලා වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ප්‍රජාව මුහුණ දී ඇති අපහසුතාවය පිළිබඳව සළකා බලා එකී සහනාධාරය හිමි විය යුතු යැයි අනුමත ප්‍රජාව වෙත එකී සහනාධාරය ලබා දීමට ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් හෝ කටයුතු කඩිනමින් සිදු කරන ලෙසත් ඉදිරියේ දී සමෘද්ධි සහනාධාර යටතේ රු.5000.00 ක දීමනාව නැවත වරක් ලබා දීම සිදු කරන්නේ නම් එකී මුදල ලබා දීමට පෝලිම් ක්‍රමය වෙනුවට මුදල සමෘද්ධි බැංකු ගිණුමට තැම්පත් කිරීමට කටයුතු සිදු කරන ලෙස අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් තමා පෞද්ගලිකව මැදිහත් වී මෙම ගැටලුව සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා සිදු කළ බවත් ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් රජය විසින් ලබා ගැනීමෙන් පසු එම සහල් තොග බෙදා හැරීමට කටයුතු සිදු කරන බවත් සඳහන් කළ බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල්. සුදර්ශන මහතා විසින් අදහස් දක්වමින් වර්තමාන ආර්ථික තත්ත්වය හමුවේ ප්‍රජාව බෙහෝ සෙයින් අපහසුතාවයකට ලක්ව ඇති මොහොතක බහුල වශයෙන් පොදු ප්‍රවාහන සේවය වෙත යොමු වී ඇති දොඩම්වත්ත අතුරු මාර්ගයෙහි බස්රථ ධාවනය නොවීම හේතුවෙන් ප්‍රජාව මෙන්ම පාසල් ළමුන් ද බොහෝ අපහසුතාවයට ලක් වන බැවින් එකී අතුරු මාර්ගය සඳහා බස් රථ සේවා සපයන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

එසේම කොස්ගහකුඹුර - හෙළවත්ත හි පිහිටා ඇති පාලමෙ හි සංවර්ධන කටයුතු මේ වන විට නතර කර ඇති බවත් පාලමක් නොමැති වීම හේතුවෙන් එකී ප්‍රදේශයේ ප්‍රජාවට ගමනාගමන කටයුතු සිදු කිරීම දැඩි සේ අසීරු වී ඇති බවත් දිගින් දිගටම ප්‍රජාවට සිදු වන අපහසුතාවය සලකා මේ පිළිබඳව සොයා බලා එකී පාලමෙ හි සංවර්ධන කටයුතු සිදු කරන තෙක් තාවකාලිකව හෝ මේ සඳහා විසඳුමක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.
එසේම ඉදි කිරීම් ක්ෂේත්‍රයේ නියුතු වූවන් ද මේ වන විට දැඩි ආර්ථික අපහසුතාවයකට ලක් වී ඇති බැවින් එකී ප්‍රජාව වෙත අවධානය යොමු කර සහල් සහනාධාරය හෝ ලබා දීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දොඩම්වත්ත අතුරු මාර්ගයේ පෞද්ගලික බස් රථයක් හෝ ධාවනය කිරීමට ගරු ආණ්ඩුකාරතුමන්ගෙන් අවසර ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති වයි. එම්. නිමල් අමරසිරි මහතා ද මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දක්වමින් දොඩම්වත්ත මාර්ගයේ මෙන්ම මැණික්කන්ද මාර්ගයේ ද බස්රථ ධාවනය නොවීම හේතුවෙන් ප්‍රජාව මෙන්ම පාසල් ළමුන් ද බොහෝ අපහසුතාවයට ලක් වන බවත් වත්මන් ආර්ථික තත්ත්වය හමුවේ ඉන්ධන මිල ඉහළ යාමත් සමඟ ත්‍රී රෝද රථ ගාස්තු සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වී ඇති පසුබිමක එකී අතුරු මාර්ග සඳහා බස් රථ සේවා සැපයීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාහර් මහතා අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා ගේ වෛද්‍යාධාර මේ වන තුරු ලැබී නොමැති බැවින් එය ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් වතු ආශ්‍රිත ප්‍රදේශවල විදුලිය කප්පාදුවත් සමඟ හොරුන් වැඩිවී ඇති බැවින් වීථි පහන් සවි කිරීම සිදු කරන ලෙස අදාල පාර්ශව දැනුවත් කරන ලෙසත් , ඉන්දියන් රජය මගින් ලබා දුන් ආධාර යටතේ ලද වියළි ආහාර ලබා දීම පිළිබඳ තමිල්නාන්ඩු මහ ඇමති ගරු ස්ටාලින් මහතා වෙත තම ස්තූතිය ප්‍රකාශ කරන බවත්, වතු ආශ්‍රිත ජනතාව සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමේ දී අවශ්‍ය ඉදිරි වැඩ කටයුතු සිදු කරන ශ්‍රී ලංකා කම්කරු කොන්ග්‍රස් පක්ෂයේ නායක ගරු අමාත්‍ය සෙන්දිල් තොන්ඩමන් මහතා ඇතුලු සියලුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.